| ව්‍යාපාර අධ්‍යනය II<br>Business Studies II | 32 | S | II | 13 ශ්‍රේණිය | කාලය : පැය තුනයි<br>Three hours |
|---|---|---|---|---|---|

විභාග අංකය ---------------------------------------------------------------------------

උපදෙස්:-

**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1) දීප්ති නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එම ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීම ඇය විසින්ම සිදු කරයි. ඇඳුම් මැසීම පිළිබඳ දක්ෂ සේවිකාවන් දෙදෙනෙකු ද ඇයට සහය ලබා දෙන අතර නිතර ම නව විලාසිතාවන් හා නිශ්පාදනවල මිල පිළිබඳව අවධානය යොමු කරන නිසා ඇයගේ නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීයව ද ඉතා ඉහළ ඉල්ලුමක් පවතින බැවින් ඇයගේ ව්‍යාපාරික අරමුණු ඉතා පහසුවෙන් ඉටු කර ගැනීමට හැකියාව ලැබී ඇත.

i. (අ) මෙම ව්‍යාපාරයේ නිමි ඇඳුම් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පැවතීම කෙරෙහි බලපාන හැකි සාධක දෙකක් සඳහන් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ව්‍යාපරික අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. මෙම ව්‍යාපාපරයට අදාළ නිශ්පාදන ක්‍රියාවලිය දක්වන්න. (ලකුණු 04)

iii. (අ) දීප්ති සතු ශක්තීන් දෙකක් සඳහන් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ නිමි ඇඳුම් විදේශ රටවලට අලෙවි කරීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමවේදය සඳහන් කර එය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. (අ) "ශදු අත විශ්ලේෂණය" ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පැහඅදිලි කරන්න

(ආ) මෙම ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව දෙකක් සඳහන් කර එසේ ඇල්මක් දැක්වීමට හේතු දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

v. ආර්ථිකයේ පැවැත්මට මෙම ව්‍යාපාරය දායකත්වය ලබා දෙන ආකාර හතරක් පැහදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

2) i. ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශවයන්ට ව්‍යාපාර විසින් ඉටු කළ යුතු සමාජ වගකීම් රාශියකි. ඒ අනුව සමාජය කෙරෙහි ව්‍යාපාර වගකීම් ඉටු කළ යුතු ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. (අ) තිරසාර සංවර්ධනය යන්න පැහැදිලි කරන්න.

(ආ) පරිසර තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාර කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. (අ) ව්‍යාපාර අචාර ධර්ම යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු වන සමාජ සංස්කෘතිය හා සංවිධාන සංස්කෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. (අ) රජයක අරමුණු හතරක් සඳහන් කරන්න.

(ආ) "රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම වැදගත් වේ." පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. (අ) "ආර්ථික ස්ථායීතාවය" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත වර්ග 02ක් විස්තර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

3) අමල් හා කමල් එක්ව දිලෙන තරු නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර රස කැවිලි නිෂ්පාදනය කර බෙදා හැරීම ආරම්භ කරන ලදී.

i. (අ) හවුල් ව්‍යාපාරක සුවිශේෂී ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහන් කරන්න. (ලකුණු 04)

ii. (අ) ඇපයෙන් සීමිත සමාගමක දැකිය හැකි ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ආ) අක්වෙරල සමාගමක් ශ්‍රී ලංකාවට වැදගත් වීමට හේතු 2ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. සමුපකාර ව්‍යාපාරයක ලක්ෂණ සාමාජිකත්වය , ප්‍රාග්ධනය , ලියාපදිංචිය, වගකීම යන කරුණු ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ආ) ව්‍යවසායී ශ්‍රී ලංකාවක් යන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වන "හරිත ණය" හඳුන්වන්න. (ලකුණු 04)

v. (අ) ව්‍යාපාර සංයෝජනය වීම දෙආකාරයකින් සිදු කළ හැකි වේ. එය පැහැදිලි කරන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවක දැකිය හැකි ලක්ෂණ 04ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

4) i. මූල්‍ය ගනුදෙනු සුරක්ෂිත කිරීම හා කාර්යක්ෂම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ ආකාරයෙන් දායකත්වය ලබා දේ. ව්‍යාපාරවල සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාර හතරක් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. අ) චෙක්පතක් පිටසන් කිරීම යනු කුමක් ද?

(ආ) චෙක්පතක පිටසන් යෙදීම අවශ්‍ය අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 04)

iii. (අ) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග හතරක් සඳහන් කරන්න.

(ආ) ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. (අ) ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර හතරක් සඳහන් කරන්න.

(ආ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

v. (අ) වෙළඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.

(ආ) විදේශ වෙළඳාම සඳහා පදනම් වූ සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

## II කොටස

5) i. බලතල හෙවත් අධිකාරිය අනුව කළමනාකරුවන් වර්ග කර එක් එක් කළමානකරුවන්ට අදාළ කාර්ය දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. (අ) සැළසුම් සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම හතරක් සඳහන් කරන්න.

(ආ) පාලන ක්‍රියාවලියට අදාළ පියවර පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. (අ) තිරස් සන්නිවේදනය යනු කුමක් ද?

(ආ) නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු සඳහන් කරන්න.

(ලකුණු 04)

iv. කාණ්ඩ නිෂ්පාදනයේ වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. (අ) ව්‍යාපාරයක ලාභ හෝ අලාභ නොලබන නිෂ්පාදන හෝ අලෙවි මට්ටම සමච්ඡේදය ලක්ෂ්‍යයි. සමච්ඡේද ලක්ෂ්‍යවිග්‍රහ කිරීමේ ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(ආ) ශ්‍රම ඵලදායීතාවය වර්ධනය කරගත හැකි ආකාර හතරක් දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

6) i. මහා පරිමාණ නිෂ්පාදන ආයතනවල මෙහෙයුම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කර ගැනීමට යොදා ගැනෙන නව නිෂ්පාදන ක්‍රම හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. (අ) ආයතනයකට තත්ව පාලනය වැදගත් වීමට හේතු හතරක් සඳහන් කරන්න.

(ආ) තත්ව පාලනය සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. (අ) අලෙවිකරණ හර සංකල්පයක් වන ගෙවන ලද මාධ්‍ය හා උපයන ලද මාධ්‍ය පැහැදිලි කරන්න.

(ආ) වෙළඳපොළ ඛණ්ඩනයේ ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iv. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. (අ) ඇසුරුමක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(ආ) අලෙවි ප්‍රවර්ධන උපකරණයක් වන "ප්‍රචාරණය" පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

7) i. ව්‍යාපාර සංවිධානයක අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග දෙකක් හා ඒවායේ සීමා දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. (අ) මූල්‍ය කලමනාකරණයේ දී මූල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ දෙක පැහැදිලි කරන්න.

(ආ) මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. කොටස් වෙළඳපොලේ සුරැකුම්පත්වල ආයෝජනයෙන් ලැබෙන සෘජු ප්‍රතිලාභ හා ව්‍යු ප්‍රතිලාභ දෙක බැගින් පැහැදිලි කරන්න.

iv. (අ) 'රැකියා විස්තරය' හා 'රැකියා පිරිවිතරය' අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

(ආ) රැකියා නියෝජිත ආයතන මගින් සේවකයන් ආකර්ශනය කර ගැනීමෙන් ව්‍යාපාරයක් අත්කර ගන්නා වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. (අ) පරිවාස කාලය තුළදී සේවකයාට සිය තනතුරේ රාජකාරි හා වගකීම් නිසි අයුරින් ඉටු කිරීමට නොහැකි වූ විට කළමනාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් දක්වන්න.

(ආ) අයදුම්කරුවෙකු තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් නම් කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)

8) i. (අ) **"සංවේතන කළමනාකරණය"** යන්න පැහැදිලි කරන්න.

(ආ) සෞඛ්‍යය හා ආරක්ෂාව කළමනාකරණය මගින් සේවා යෝජකයාට අත්වන ප්‍රතිලාභ හතරක් දක්වන්න. (ලකුණු 04)

ii. (අ) "සේවක ප්‍රවාසිතාව" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) සාමූහික ගිවිසුමක් මගින් සේවකයන්ට හිමි වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. (අ) දත්ත හා තොරතුරු අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(ආ) ඵලදායී තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරයට ඇති වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 04)

iv. (අ) ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(අ) "ව්‍යාපෘති සාරාංශය" ලෙස හඳුන්වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

v. (අ) මානව සම්පත් සැලැස්මක ඇතුලත් විය යුතු මූලිකාංග පැහැදිලි කරන්න.

(ආ) තරඟකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 4x5 = 20)